# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022**

**2025 ජූලි**

**සමාජීය විද්‍යා පීඨය**

**සමාජ විද්‍යාව**

**(නව නිර්දේශය)**

**දකුණු ආසියාතික සමාජය SOCI 38214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ඓතිහාසික හා භූගෝලීය සාධක දකුණු ආසියාවේ සමාජ සහ සංස්කෘතික භාවිතයන් හැඩගස්වා ඇත්තේ කෙසේද සහ එම සාධක සමකාලීන සමාජ-ගතිකත්වයට සහ අනන්‍යතා ගොඩනැගීමට බලපෑම් කරන්නේ කෙසේද?

02. දකුණු ආසියාව තුළ 'විවිධත්වය සහ ඒකීයත්වය' සඳහා දායක වන ප්‍රධාන සාධක මොනවාද? කලාපයේ දී 'විවිධත්වය තුළ ඒකීයත්වය' යන සංකල්පය පිළිඹිබු වන්නේ කෙසේද?

03. මූලාරම්භය, මූලික ලක්ෂණ සහ සමකාලීන බලපෑම් සංසන්දනය කරමින් ශ්‍රී ලංකාවේ හින්දු කුල ක්‍රමය සහ සිංහල කුල ක්‍රමය එකිනෙකින් වෙනස් වන්නේ කෙසේද? සංසන්දනාත්මකව විමසන්න.

04. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ගැමි සමාජයේ සිදුව ඇති සමාජීය හා ආර්ථික පරිවර්තන සහ ඒ ආශ්‍රිත ගැටලු මොනවාදැයි සාකච්ඡා කරන්න.

05. දකුණු ආසියාවේ වේගවත් නාගරීකරණය නාගරික සමාජ අසමානතා උග්‍ර කරන්නේ කෙසේද? පැහැදිලි කරන්න.

06. ශ්‍රී ලංකාවේ ජනප්‍රිය බුද්ධාගම ක්‍රියාත්මක වන ආකාරය සහ එහි සමාජීය බලපෑම පිළිබඳ විවේචනාත්මක විශ්ලේෂණයක් කරන්න.

07. විවාහ රටා, ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ භූමිකා සහ පවුල් ව්‍යුහයන් වෙනස් වී ඇති ආකාරය කෙරෙහි අවධානය යොමු කරමින් නවීකරණය සහ ගෝලීයකරණය දකුණු ආසියාවේ සාම්ප්‍රදායික විවාහවලට කොතරම් දුරට බලපා තිබේදැයි විමසන්න.

08. මානවකේන්ද්‍රීයවාදය විවිධ කණ්ඩායම් අතර බලපා ඇත්තේ කෙසේදැයි ශ්‍රී ලංකා සමාජය ඇසුරෙන් පරීක්ෂා කරන්න.

**************************